# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 5 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1983 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20යි    තැපැල් ගාස්තුව : ශත 50යි

1983 අංක 5 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 21/81

මහා නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 5 දරන මහා නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මහා නගර සභා ආඥාපනතේ 272 වන වගන්තියේ (6) වන ඡේදයේ (ඇ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *252 වන අධිකාරයේ 272 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ඇ) යම් වීථියක හෝ වීථියකට යාව සිටින සේ දැන්වීම් පුවරු හා වෙනත් තාවකාලික ව්‍යුහයන් ඉදිකිරීම හෝ යම් වර්ගයක සැරසිල්ලක් කිරීම හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම.".

3. නගර සභා ආඥාපනතේ 157 වන වගන්තියේ (7) වන ඡේදයේ (ඊ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— *255 වන අධිකාරයේ 157 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ඊ) යම් වීථියක හෝ වීථියකට යාව සිටින සේ දැන්වීම් පුවරු හා වෙනත් තාවකාලික ව්‍යුහයන් ඉදිකිරීම හෝ යම් වර්ගයක සැරසිල්ලක් කිරීම හා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම;".

ඒ 66533—12,800 (82/11)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළැඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.